MEDIA RELATIONS UNIT
International Committee of the Red Cross
19, avenue de la Paix
1202 Geneva
Switzerland
Phone: +41 22 730 3443
Fax: +41 22 734 8280
press.gva@icrc.org
http://www.icrc.org

***ජාත්‍යන්තර රතු කුරුස කමිටුව: ප්‍රවෘත්ති නිවේදන අංක 09/18***
**2009 ජුලි මස 9 වන දින**

## ශ්‍රී ලංකාව - ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ ක්‍රියාන්විතයන් අඩුකිරීම

කොළඹ/ජිනීවා (ජාත්‍යන්තර රතු කුරුස කමිටුව) - ශ්‍රී ලංකා රජයත්, ඊලාම් විමුක්ති කොටි සංවිධානය (LTTE) ත් අතර පැවති ක්‍රියාකාරී ගැටුම් අවසන්වීමත් සමගින්, ශ්‍රී ලංකා රජය වෙතින් ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට තම ක්‍රියාකාරකම් ශ්‍රී ලංකාව තුල අඩුකරණ ලෙසට ඉල්ලීමක් කෙරුනි.

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (ICRC) 1989 සිටම ශ්‍රී ලංකාව තුල ස්ථිර ලෙසින් පැවතියේය. එහි ක්‍රියා පටිපාටිය වෙනස්වන අවශ්‍යතාවනට අනුව යමින් වසරක් පාසා ව්‍යාප්ත වුනි. ප්‍රථමයෙන්, 1980 අග භාගයේදි රටේ දකුණු පෙදෙස්හි හටගත් කැරලි ස්වභාවය නිසා උද්ගතවූ අවශ්‍යතාවනට ICRC ආයතනය ප්‍රතිචාර දක්වන්න ලදි. පසුව ශ්‍රී ලංකා රජයත්, ඊලාම් විමුක්ති කොටි සංවිධානය (LTTE)ත් අතර පැවති ගැටුම් වලට අනුයුක්තව ICRC තම මානුෂීය ක්‍රියාකාරකම් දිගටම කරගෙන ගිය අතර, එම ක්‍රියාකාරකම් මේ වසරේ මුල් භාගය තෙක්ම නොනවත්වා පැවතුණි.

"ICRC, ශ්‍රී ලංකාව තුල තම ස්ථානගතවීම් හා එහි ක්‍රියාන්විත ප්‍රමුඛතාවයන් ගැන පසුනිරීක්ෂණයක් කරමින් සිටී" යැයි ආයතනයේ දකුණු ආසියා ක්‍රියාන්විත ප්‍රධානී, ජැකෝස් ඩී මායෝ මහතා ප්‍රකාශ කරයි. "මෙහි පළමු පියවරක් ලෙසින්, ආයතනය තම නැගෙනහිර පළාතේ ස්ථාපිත කාර්යයාල වසා දමා විදේශික සේවකයන් එම පෙදෙස් වලින් ඉවත් කිරීමෙන් ක්‍රියාකාරකම් නිමාකරලීමට කටයුතු කරනු ඇත. එනමුත්, ICRC මානුෂීය ප්‍රශ්න සම්භන්ධයෙන් තම කථිකාවන් දිගින් දිගටම ශ්‍රී ලංකා රජයත් සමගින් කරගෙන යනු ඇත."

තමන්ගේ භූමිකාවට අනුරූපව, ජාත්‍යන්තර රතු කුරුස කමිටුව මෑත කාලයේ හටගත් ගැටුම හේතුවෙන්, අවතැන්වූවන් මෙන්ම නැවත පැමිණි අයද ඇතුලුව සෘජුව මෙන්ම වක්‍රාආකාරයෙන් බලපෑමට ලක්වූවන්ගේ මානුෂීය අවශ්‍යතා සපුරාලීමට ඇති තම කැපවීම නැවතත් සහතික කරයි.

**වැඩි විස්තර සඳහා අමතන්න:**
**සරසි විජේරත්න ජාත්‍යාන්තර රතුකුරුස කමිටුව : කොළඹ**
**ටෙලි: +94 112 503346 හෝ 0773-158844**
**සයිමන් ෂෝනෝ ජාත්‍යන්තර රතුකුරුස කමිටුව : ජිනීවා**
**ටෙලි: + 41 79 251 93 02**
**අපගේ වෙබ් අඩවිය: www.icrc.org**